www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපදය ආර්ථික පසුබෑමට ඇද වැටෙද්දී දදේනි හා පාරිභෝගික වියදම් හැකිලී යයි

## GDP, consumer spending contract as US plunges into recession

**පැට්‍රික් ඕ කෝනර් විසිනි**
**2008 ඔක්තෝබර් 31**

එක්සත් ජනපද වෙලඳ දෙපාර්තමේන්තුව විසින් ඊයේ නිකුත් කල දල දේශීය නිෂ්පාදිතයේ (දදේනි) සංඛ්‍යාලේඛන අනුව, ජූලි-අගෝස්තු කාර්තුවේ වාර්ෂික පදනමක ගනන් බැලූ ආර්ථික සංකෝචනය සියයට 0.3 කි. අවසන් කාර්තුවේ දදේනි ඊටත් වඩා නරක අතට හැරේ යයි අර්ථශාස්ත්‍රඥයන් කරන ගනන් බැලීම් මධ්‍යයේ, අලුත්ම දත්ත තහවුරු කරන්නේ ආර්ථිකය පසුබැස්මකට ඇතුල්වී අවසාන බවයි.

පාරිභෝගික වියදම් 1980 න් පසුව වාර්තාවූ විශාලතම වැටීමටත්, ප්‍රථම වතාවට 1991 න් පසුව සියයට 3.1 කින් සංකෝචනය වීමටත් මුහුන පෑම හමුවේ තෙවෙනි කාර්තුවේ දදේනි රින අගයක් ගත්තේය.

පසුගිය වකවානුවේ ආර්ථික කටයුතුවලින් තුනෙන් දෙකකටත් වඩා වැඩි පංගුවකට වගකියන ලද පාරිභෝගික වියදම්වලින් කොටසකට හේතු වූයේ, පුද්ගලික නය ගනුදෙනුය. එහෙත් රැකියාවලින් නෙරපා හැරීම්, නිවාස අත්පත් කර ගැනීම් හා ජීවන වියදම් ඉහල යාමත්, විශ්‍රාමික ඉතිරිකිරීම්වල වටිනාකම් පහල වැටීමත් මගින් ජනගහනයේ පුලුල් කොටස් මත ව්‍යසනකාරී බලපෑමක් ඇතිකර තිබේ. බදු ගෙවීමෙන් පසුව උද්ධමනයට ගලපන ලද ආදායම වශයෙන් සලකන පුද්ගලික මූර්ත ආදායමේ තෙවෙනි කාර්තුව තුල සිදුවූ සියයට 8.7 ක අසාමාන්‍ය පිරිහීම ගැන වෙලඳ දෙපාර්තමේන්තුව වාර්තා කලේය. මෙය දත්ත සටහන් තැබීම ආරම්භ කල 1947 වසරේ පටන් වාර්තාගත විශාල ම වැටීමයි.

බුෂ් පරිපාලනයේ ප්‍රථම ආර්ථික පනගැන්වීමේ ක්‍රියාවලිය නිසා ලැබුනු බදු සහන නිසා, වාර්ෂික පදනමෙන් ගත් කල දෙවැනි කාර්තුව තුල මූර්ත ආදායම සියයට 11.9 න් ඉහල ගියේය. එහෙත් ආදායමේ ඉහල නැගීමට සාපේක්ෂව පාරිභෝගික වියදම් ඉහල නොයාම පුදුමයට කාරනයක් නොවේ. ඔක්තෝබරය දක්වා වූ තෙමස තුල ආහාර, රෙදිපිලි වැනි එදිනෙදා අවශ්‍ය පාරිභෝගික භාන්ඩ මිලදී ගැනීම්, 1950 න් පසු දරුනුම කඩාවැටීමට මුහුන පෑවේය. ඒ සියයට 6.4 කිනි. මෝටර් රථ, ගෘහ භාන්ඩ වැනි කල් පවතින පාරිභෝගික භාන්ඩ අලෙවිය සියයට 14.1 කින් වැටුනි.

වාර්ෂික පදනමක නිවාස ආයෝජන සියයට 19.1 කින් කඩා වැටුනි. ''පාරිභෝගික නොවන මූර්ත ස්ථාවර ආයෝජන'' එනම් යන්ත්‍රෝපකරන, වාහන හා පරිගනක ඇතුලත් ප්‍රාග්ධන භාන්ඩවල ව්‍යාපාරික ආයෝජන සියයට 1 කින් පහත වැටීම ද දදේනි දත්ත වාර්තාවට ඇතුලත්ය.

තෙවෙනි කාර්තුවේ දල ජතික නිෂ්පාදිතයෙහි හැකිලීම බලාපොරොත්තුවූ තරම් බරතල නොවීය. 30 වන දින අවසානයේ ඩව් ජෝන්ස් දර්ශකය සියයට 2.1 කින් නැගුනු අතර කොටස් වෙලඳපොල ආන්තිකව ඉහල ගියේය. කෙසේ වුව ද, ගෝල්ඩ්මන් සැක්ස් අර්ථශාස්ත්‍රඥයා ඔවුන්ගේ ගනුදෙනු කරුවන්ට අනතුරු ඇගවූයේ, දදේනි තත්වය ''කොටස් වෙලඳපොලේ ආරම්භක ප්‍රතිචාරයෙන් ඇගවුම් කලාට වඩා දුබල'' බවයි.

යුරෝපයට හා ආසියාවට නොකඩවා කෙරෙන අපනයනයන්ගේ වර්ධනය මගින් වෙලඳ ශේෂයේ හිගය තුනී නොකලේ නම් දත්ත මීට වඩා සැලකිය යුතු තරම් නරක අතට හැරීමට ඉඩ තිබුනි. ඇමරිකාව සමඟ ලෝක ආර්ථිකය ගැඹුරු පසුබැස්මකට ඇද වැටීමත් සමඟ අපනයනය වර්ධනය පහත වැටෙමින් තිබේ. ඊට අමතරව තෙවෙනි කාර්තුවේ දදේනි තියුනු හැකිලීමක් වලක්වනු ලැබුවේ, වාර්ෂික පදනමකින් ෆෙඩරල් ආන්ඩුවේ වියදම් හා ආයෝජන සියයට 13.8 කින්, බොහෝ කොටම මිලිටරි පිරිවැයෙහි සියයට 18.1 කින් ඉහල යාම හේතු කොට ගෙනය.

*වෝල් ස්ට්‍රීට් ජර්නලය* ට අනුව අලුත්ම දත්තවලින් ඇගවුම් කලේ ''සමහර විට සැප්තැම්බර් මැද භාගයේ නය මිරිකී යාමට ප්‍රථමයෙන්ම'' ආර්ථිකය පසුබැස්මකට මුහුනපා සිටි බවය. එමෙන්ම අවසන් කාර්තුවේ දදේනි වර්ධනය රින සියයට 4 ක් තරම් පහත වැටිය හැකි බවයි.

ඩිසිෂන් ඉකොනොමික්ස් හි ඇලන් සිනායි නිව් යෝර්ක් ටයිම්ස් වෙත මෙසේ පැවසීය. ''ආර්ථිකය මහා පරිමානයෙන් අතිශය නරක අතට හැරී තිබේ. පරිභෝජනය පොදුවේ මුලු ගැන්නී ඇත. එය ඊලඟ කාර්තු දෙකෙහි ආර්ථිකය ගැන ඉතා නරක ආරංචි පිලිබඳ පූර්විකාවකි. පාරිභෝගිකයා වටා ඇති මූලධර්ම රිනාත්මකය. කිසිදු උපකාරයක් කොතැනකින් හෝ ඉක්මනින් ලැබීම ගැන කිසිදු සලකුනක් නැත.''

ලංඩන් නුවර මාධ්‍යගතව ඇති සීමාසහිත කැපිටල් ඉකොනොමික්ස් හි පෝල් ඇෂ්වර්ත් රොයිටර් වෙත ප්‍රකාශ කලේ, එක්සත් ජනපද ආර්ථිකය 2009 දී සියයට 1.5 කින් හැකිලී ගොස් 2010 වසරේදී එකතැන පල්වේ යයි තමා අපේක්ෂා කරන බවයි. ''සමස්තයක් වශයෙන් දදේනි මට්ටම ඒකාබද්ධව සියයට 2.5 කින් සංකෝචනය වීම මඟින්, මෙය මහා අවපාතයේ පටන් ඇතිවූ නරකම පසුබෑමක් බවට පත්වේයයි අපි බලාපොරොත්තු වන්නෙමු.'' ඔහු තවදුරටත් පැවසීය.

ඔක්තෝබර් 25 දිනෙන් අවසන් සතිය තුල නව විරැකියා සහන ඉල්ලීම් පෙර සතියේ සිට එක එල්ලේ 479,000 කින් ඉහල නැඟුනු බව කම්කරු දෙපාර්තමේන්තු දත්තවලින් පෙන්නුම් කෙරේ. ආර්ථික විද්වතුන් පොදුවේ සලකනු ලබන්නේ 400,000 ත් ඉහල සංඛ්‍යා ආර්ථික පසුබෑස්මක් ඇඟවුම් කරන බවයි. රොයිටර් මෙසේ ද පැවසීය. ''එක දිගට වැඩිවන ඊනියා ඉල්ලීම් මිලියන 3.74 ක් වන බව විශ්ලේශකයන්ගේ තක්සේරුවයි. එය එක දිගට ඉල්ලීම් මිලියන 3 ඉක්මවා ගිය 27 වන සතිය වන අතර, රෝගී තත්වයට පත් ආර්ථිකය තුල එක්සත් ජනපදයේ කම්කරුවන්ට රැකියා සොයාගැනීම දුෂ්කරවී ඇති බව ඉන් ඇඟවුම් කරයි.''

ගනන් බලා ඇති පරිදි මෙම වසර තුල රැකියා 760,000 ක් අහෝසි වී තිබේ. ඊයේ දිනය තුල පහත සඳහන් ලෙස රැකියා කප්පාදුව හා ව්‍යාපාරවල ලාභ නිවේදනය කර තිබුනි.

* 2009 වසර අවසන් වන විට ඩොලර් බිලියන 1.8 කින් වියදම් අඩුකර ගැනීමේ අරමුන සහිත ප්‍රති ව්‍යුහකරන සැලැස්මක කොටසක් වශයෙන්, ක්‍රෙඩිට් කාඩ් යෝධයෙකු වන ඇමරිකන් එක්ස්ප්‍රස් සිය ශ්‍රම හමුදාවෙන් සියයට 10 ක් පමන වන කම්කරුවන් 7,000 ක් සේවයෙන් ඉවත් කරන බව නිවේදනය කලේය.

* වැඩි කොටම ජංගම දුරකථන අලෙවිය පහත වැටීම නිසා, මෝටරෝලා ඉලෙක්ට්‍රොනික් හා දුරකථන සමාගමේ  මෙම කාර්තුවට මිලියන 397 ක අලාභයක් වාර්තා විය. එය සේවක මන්ඩලයෙන් තවත් 3,000 ක් ඉවත් කිරීමට සැලසුම් කර ඇත.

* පහත වැටෙන සිල්ලර අලෙවිය මධ්‍යයේ කාර්තුවට මිලියන 310 ක ශුද්ධ අලාභයකට මුහුනපෑ පරිගනක ක්‍රීඩා නිෂ්පාදනය කරන ඉලෙක්ට්‍රොනික් ආර්ට්ස් සමාගම සිය සේවකයන්ගෙන් සියයට 6 ක් දොට්ට දමන බව වාර්තා කලාය.

*කාර්තුවට අපේක්ෂිත ලාභය අත්කර ගැනීමට අසමත් වූ ඊස්ට්මන් කොඩැක් ඡායාරූප සමාගම නිශ්චිතව සඳහන් නොකල රැකියා ප්‍රමානයක් කපන බව නිවේදනය කර ඇත.

* සිය මාධ්‍ය වත්කම්වලින් බිලියන 14 ක වටිනාකම් කපා හල සීබීඑස් මාධ්‍ය ජාලය කාර්තුවට ලැබූ අලාභය බිලියන 12.6 කි.

* කඩදාසි හා ඇසුරුම් සමාගමක් වන ඉන්ටර්නැෂනල් පේපර්, 2007 ට සාපේක්ෂව මෙම වසරේ තෙවැනි කාර්තුව සඳහා සිය ලාභය සියයට 37 කින් අඩුවී ඇති බව නිවේදනය කලේය. සමාගම මෙම වසර තුල ජොර්ජියා, කැලිෆෝර්නියා, ඔහායෝ හා ඔරිගන්වල කම්හල් වසා දමා කම්කරුවන් ඉවත් කල අතර ඉල්ලුම වැටීමේ අර්ථය ''පරිමාව තවත් අඩු කිරීම'' බවට අනතුරු ඇඟවීය.

විනාශයට මුහුනපා ඇති මෝටර් රථ කර්මාන්තයේ රැකියා කප්පාදුව තවදුරටත් සිදුවෙමින් තිබේ. මිචිගන්හි සැපයුම් කරුවන් තිදෙනෙක් ඊයේ මේ බව නිවේදනය කලේය.

*ෆෝර්ඩ් මෝටර් රථ උපාංග නිකුත් කරන විස්ටියන් කෝපරේෂන් ඊයේ කියා සිටියේ කාර්තුවට තමන් ලැබූ අලාභය මිලියන 188 ක් බවයි. සමාගම පැය ගනනට වැඩ කරන හා ස්ථිර වැටුප් ලබන එහි සේවකයන් 2,000 ක් පමන පසුගිය තෙමස තුල අස්කර දැමූ අතර තවත් 800 ක් ස්ථිර සේවකයන් ඉවත් කිරීමේ සැලසුමක් ඇති බව කියා සිටියේය.

* ටීආර්ඩබ්ලිව් ඔටෝමෝටිව් හෝල්ඩිංග්ස්, කාර්තුවට මිලියන 54 ක අලාභයක් වාර්තා කලාය. ප්‍රධාන විධායක ජෝන් ප්ලාන්ට් කියා සිටියේ සමාගම සිය සේවක සංඛ්‍යාව ''හරි ප්‍රමානයට'' ගෙන එන බවය. ස්ථිර තනතුරු 1,000 ක් පමන කපා හරිමින් ඇති අතර බහුතරය සති අන්තය වන විට ඉවත් කෙරෙනු ඇත.

* ''උතුරු ඇමරිකාවේ ආර්ථික පසුබෑස්මක පීඩනය හා යුරෝපයේ වැඩිවන අර්බුදය හමුවේ'' ලියර් කෝපරේෂන් කාර්තුවට මිලියන 98 ක් පාඩු විඳීය. එලඹෙන වසර තුල මිලියන 150 ක් ඉතිරි කර ගැනීමට සමාගම අධිෂ්ඨාන කර සිටින බව සමාගම කියා ඇතත් කපන රැකියා ප්‍රමානය තවමත් නිවේදනය කර නැත.

ජෙනරල් මෝටර්ස් හා ක්‍රයිස්ලර් සමාගම් ආන්ඩුවේ අරමුදල්වලින් බද්ධ වීමේ ඉඩ කඩ ගැන වාර්තා වීමත් සමඟ මෝටර් රථ ක්ෂේත්‍රයේ රැකියා කප්පාදුව වේගවත් වී තිබේ.

ග්‍රාන්ට් තෝන්ටන් එල්එල්පී ගිනුම්කරන සමාගමේ කිම්බර්ලි රොඩ්රිගස් *වොල් ස්ට්‍රීට් ජර්නලය* ට කියා ඇත්තේ එවන් බද්ධ වීමකින් ක්‍රයිස්ලර් හි රැකියා 30,000-40,000 ත් අතර ප්‍රමානයක් ද, සැපයුම් කරුවන්ගේ අමතර රැකියා 50,000 ක් ද නැතිවේ යයි තමන් සිතන බවය. එම ක්ෂේත්‍රයේ විශ්ලේෂක වරියක් වන ඇය අනාවැකි පල කලේ ක්‍රයිස්ලර් හි මෝටර් රථ එකලස් කිරීමේ කම්හල් 14 න් 7 ක් වැසීයන බව හා කාර් මොස්තර 26 න් 19 ක් කටුගා දැමෙන බවට ය.

බද්ධ කිරීම සිදු නොවුන හොත් ජෙනරල් මෝටර්ස් හා ෆෝර්ඩ් සමාගම් ද පදනම්වී සිටින සැපයුම් කරුවන් බංකොලොත් වීමට තුඩු දෙමින්, ක්‍රයිස්ලර් සමගම බිඳ වැටෙනු ඇතැයි ද ඇය පැවසුවාය.

© www.wsws.org